**පාදෙණිය - අනුරාධපුර මාර්ගය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය - 2015**

---

පාදෙණිය - අනුරාධපුර මාර්ගය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ආර්ථික සංවර්ධන සහයෝගීතා අරමුදල සඳහා රජයේ නියෝජිතායතනය වන කොරියානු අපනයන හා ආනයන බැංකුව අතර 2008 දෙසැම්බර් 19 දින එළඹි අංක එස්ආර්අයි-18 දරන ණය ගිවිසුමේ 1 ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

---

ව්‍යාපෘතියේ ණය ගිවිසුම අනුව, එවකට මහා මාර්ග, වරාය හා නාවික අමාත්‍යාංශය වර්තමානයේ උසස් අධ්‍යාපන හා මහා මාර්ග අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර සහ මාර්ග සංවර්ධන අධිකාරිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ව්‍යාපෘතියේ අරමුණු වන්නේ (අ) ශ්‍රී ලංකාවේ උතුරු මැද පළාතේ ප්‍රධාන ප්‍රවාහන කේන්ද්‍රයේ පිහිටා ඇති පාදෙණිය - අනුරාධපුර මාර්ගය අතර මාර්ග කොටස වැඩිදියුණු කිරීම මඟින් ප්‍රදේශ අතර භාණ්ඩ හුවමාරුව හා මහජන සම්බන්ධතා ක්‍රියාත්මක කිරීමට මෙන්ම ජාතික ආර්ථික සංවර්ධනය වැඩිදියුණු කිරීම සහ සමාජ පිරිවැය කපාහැරීම සහ කර්මාන්ත තරඟකාරිත්වය ඉහළ නැංවීම මඟින් ප්‍රාදේශීය සංවර්ධනය සමතුලිත කිරීම සහ (ආ) කටුනායක - පාදෙණිය මාර්ග කොටසට මාර්ගය සම්බන්ධ කිරීමටද සැලසුම් කිරීමයි. එසේම කටුනායක පිහිටි බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළ සහ සංස්කෘතික උරුමයන්ගෙන් හා සංචාරක ආකර්ෂණයෙන් පරිපූර්ණ වූ ශ්‍රී ලංකාවේ උතුරු මැද පළාත අතර මඟී ප්‍රවාහන පහසුකම් ඇති කරලීම මඟින් ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තයෙහි ජාත්‍යන්තර තරඟකාරිත්වය ශක්තිමත් කිරීමටද අපේක්ෂා කෙරේ. ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 9,670 ක් වූ අතර ඉන් එජඩො මිලියන 55 කට සමාන රු.මිලියන 7,554.03 ක මුදලක් සැපයීමට ආර්ථික සංවර්ධන සහයෝගිතා අරමුදල එකඟවී තිබුණි. 2012 නොවැම්බර් මාසයේදී රු.මිලියන 1,232.90 කට සමාන එජඩො මිලියන 11.32 ක පරිපූරක ණය මුදලක් මඟින් ආරම්භක ණය මුදල වැඩිකර තිබුණි. ව්‍යාපෘතියේ කටයුතු 2009 ජුලි 01 දින ආරම්භ කර තිබුණු අතර 2012 ජනවාරි 01 දින වන විට මාස 30 ක් තුළ නිම කිරීමට නියමිත විය. කෙසේ වුවද ව්‍යාපෘතියේ කටයුතු 2012 නොවැම්බර් 30 දින නිමකර තිබුණද, 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.4. විගණකගේ වගකීම

--------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදි. ආචාරධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාල වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටින්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උපදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියෙහි විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති හා පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වියදම ව්‍යාපෘතිය විසින් පවත්වා ගෙන යන ලද යාවත්කාලීන කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව,

(ඇ) ශ්‍රී ලංකා රජය විසින් සපයන ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය සහ ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතුවලින් උද්ගත වූ වත්කම් හා වගකීම් දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඈ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අනුගමනය කරන ලද වර්ගීකරණයට අනුව වියදම නිවැරදි හඳුනාගෙන තිබුණේද යන බව. සහ

(ඉ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේ ද යන බව.

## 2. මූල්‍ය ප්‍රකාශන

--------------

### 2.1 මතය

--------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, මා දරන්නා වූ මතය වනුයේ,

(අ) 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ 2015 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කර ඇති බව, සහ

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බවත්ය.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

-----------------------------------

#### 2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

--------------------

මාර්ග ඉදිකිරීමේ කාර්යයන් 2012 නොවැම්බර් 30 දිනට නිමකර තිබුණද, රු.මිලියන 10,639 ක් වූ ව්‍යාපෘතියේ මුළු වියදම 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහාවූ මූල්‍ය ප්‍රකාශනවල කෙරීගෙන යන වැඩ යටතේ දක්වා තිබුණි.

## 3. මූල්‍ය හා භෞතික කාර්ය සාධනය

---------------------------------

### 3.1 අරමුදල් උපයෝජනය

----------------------

මූල්‍යයනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදනය හා සමාලෝචිත වර්ෂය තුළ සහ 2015 දෙසැම්බර් 31 දක්වා අරමුදල් උපයෝජනය පිළිබඳ වැදගත් සංඛ්‍යා ලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ණය ගිවිසුම අනුව මූල්‍යයනය සඳහා එකඟ වූ මුදල | | සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුවේ කරන ලද වෙන්කිරීම | උපයෝජනය කළ අරමුදල් | | |
|---|---|---|---|---|---|---|
| | | | | 2015 වර්ෂය තුළ | 2015 දෙසැම්බර් 31 දිනට | |
| | එජඩො මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | එජඩො මිලියන | රු.මිලියන |
| ඊඩීසීඑෆ් | 66.32 | 8,786.93 | - | - | 66.32 | 9,292.15 |
| ශ්‍රීලංර | - | 2,115.97 | 31.31 | 31.31 | - | 1,335.85 |
| | 66.32 | 10,902.90 | 31.31 | 31.31 | 66.32 | 10,628.00 |

### 3.2 භෞතික ප්‍රගතිය

මාර්ගයේ ප්‍රතිසංස්කරණ කාර්යයන් නිම කර 2012 නොවැම්බර් 30 දින මාර්ග සංවර්ධන අධිකාරියට භාරදී තිබුණි. කෙසේ වුවද මාර්ගය ප්‍රතිසංස්කරණය සඳහා අත්පත් කර ගන්නා ලද ඉඩම් වෙනුවෙන් වන්දි ගෙවීම නිම කර නොතිබුණු බැවින් ව්‍යාපෘතියේ කටයුතු 2015 දෙසැම්බර් 31 දක්වා ක්‍රියාත්මක කර තිබුණි.

### 3.3 ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතු

ව්‍යාපෘතිය විසින් ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 8 ක රජයේ ඉඩම් ඇතුළත්ව ඉඩම් කොටස් 3,996 ක් අත්පත් කර ගැනීමට අපේක්ෂා කර තිබුණි. කෙසේ වුවද, 2015 දෙසැම්බර් 31 දිනට ඉඩම් කොටස් 1,005 ක් සඳහා පමණක් වන්දි ගෙවා තිබුණි. ඉන් ඉඩම් කොටස් 387 ක් පමණක් ඉඩම් අත්පත් කර ගැනීමේ පනතේ 44 වගන්තිය ප්‍රකාරව ඉඩම් ලියාපදිංචි කාර්යාලයේ ලියාපදිංචි කර තිබුණි. තවද ඉඩම් හිමිකරුවන්ට වන්දි ගෙවීමේ ප්‍රමාදයන් හේතුවෙන් රු.මිලියන 4.93 ක පොලී මුදලක් 2015 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියට ගෙවීමට සිදුවී තිබුණි.

### 3.4 මතභේදයට තුඩුදෙන කරුණු

2012 වර්ෂයේදී ව්‍යාපෘතියේ කටයුතු නිම කර තිබුණද, මාර්ග සංවර්ධන අධිකාරියෙන් ලබාගෙන තිබුණු රු.මිලියන 11.28 ක විශේෂ අත්තිකාරම නිරවුල් කිරීම සඳහා කටයුතු කිරීමෙන් තොරව 2015 දෙසැම්බර් 31 දිනට පරිශේෂව පැවතුණි.